කොළඹ විශ්ව විද්‍යාලය - ශ්‍රී ලංකාව

ශාස්ත්‍ර පීඨය

ශාස්ත්‍රවේදී දෙවන වසර පරීක්ෂණය - දෙවන සෙමෙස්තරය- 2017/18

**SOC 2218 - නාගරික අධ්‍යාපනයට හැඳින්වීමක්**

පැ දෙකයි (02)

**ඕනෑම ප්‍රශ්න තුනකට (03) පිළිතුරු සපයන්න**

---

1. නාගරික පාසලක් හඳුනා ගැනීමේදී වැදගත් වන ලක්ෂණ රටකින් රටකට වෙනස් විය හැකිද? ඔබගේ පිළිතුර පහදන්න.

2. ලූවි වර්ත් නගරයක සුවිශේෂී ලක්ෂණ තුනක් කෙරෙහි අවධානය යොමු කරමින් සිය න්‍යාය ඉදිරිපත් කළේය. මෙම ලක්ෂණ තුන නාගරික පාසලක ස්වභාවය අවබෝධ කර ගැනීමේදී උපයෝගී වන ආකාරය උදාහරණ සහිතව සාකච්ඡා කරන්න.

3. නගරය තුළ විවිධ සමාජ ආර්ථික මට්ටම් නියෝජනය කරන පිරිස් විසිරී ඇති ආකාරය ශ්‍රී ලාංකේය නාගරික පාසල්වල විවිධත්වය කෙරෙහි බලපා ඇති ආකාරය උදාහරණ සහිතව පහදන්න.

4. නාගරික පාසලක ගුරුවරයා නාගරික නොවන පාසලක ගුරුවරයකුට වඩා වෙනස් විය යුතුයැයි ඔබ සිතන්නේද? ඔබගේ පිළිතුර විචාරාත්මකව පහදන්න.

5. නාගරික පාසල්වල අධ්‍යාපනය ලබන දරුවන්ගේ දෙමාපියන් නාගරික නොවන පාසල්වල අධ්‍යාපනය ලබන දරුවන්ගේ දෙමාපියන්ට වඩා තම දරුවන්ගේ අධ්‍යාපනය පිළිබඳව උනන්දු විය යුතුයැයි මතයක් තිබේ. මෙම මතය විචාරාත්මකව විශ්ලේෂණය කරන්න.

6. නාගරික පාසල් ගුරුවරු නාගරික නොවන පාසල්වල ගුරුවරුන්ට වඩා සිය වෘත්තිය හා බැඳුනු ආතතියකට මුහුණ දෙති. මෙවැනි ආතතියක බලපෑම ගුරුවරයා සිය වගකීම් ඉටු කරන ආකාරය කෙරෙහි බලපාන්නේ කෙසේදැයි විචාරාත්මකව සාකච්ඡා කරන්න.

*************************************